# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

NERDC

# තනතුරු පුරප්පාඩු

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (නර්ඩ්) ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රජයේ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන අතර, බහුවිධ ඉංජිනේරු පර්යේෂණ සහ නවෝත්පාදන කටයුතුවල නියැළී සිටී. දක්ෂ ඉංජිනේරුවන් 60 කට ආසන්න සංඛ්‍යාවක් සහ සහායක කාර්ය මණ්ඩලය 200 කට අධික සංඛ්‍යාවකින් යුත් කණ්ඩායමක් සමග, නව්‍ය තාක්ෂණයන් හඳුන්වාදීම, පර්යේෂණ ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම සහ ජාතික සංවර්ධනය සඳහා නිෂ්පාදන සහ තාක්ෂණයන් වාණිජකරණය කිරීම සඳහා නර්ඩ් ආයතනය කැපවී සිටී.

ආයතනයේ අනාගත අභිවෘද්ධිය සහ ආයතනය උපායමාර්ගික දිශානතියකට ගමන්කරවීම සඳහා, නායකත්ව හැකියාවන් සහ අභියෝග භාරගැනීමට කැමැත්තක් දක්වන දක්ෂ, කාර්යශූර වෘත්තිකයන්ගෙන් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුරේ නම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කාණ්ඩ |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (මුදල්) | 01 | HM 1-3 |
| 2 | අධ්‍යක්ෂ (මානව සම්පත්) | 01 | HM 1-3 |

**පොදු සුදුසුකම් :-**

- විශිෂ්ට නායකත්ව සහ කණ්ඩායම් කළමනාකරණ හැකියාවන්
- ස්වාධීනව වැඩ කිරීමට සහ අභියෝගාත්මක කාර්යයන් භාර ගැනීමට ඇති හැකියාව
- ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් සහ ආයතනික විශිෂ්ටත්වය වෙනුවෙන් කැපවීම
- විශිෂ්ට සන්නිවේදන සහ ඉදිරිපත් කිරීමේ කුසලතා
- පරිගණක සාක්ෂරතාව සහ නවීන කළමනාකරණ පද්ධති පිළිබඳ හුරුව

අදාළ සියලු තොරතුරු සහ අයදුම්පත ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDC) නිල වෙබ් අඩවියෙන් (www.nerdc.lk/Tenders and Notices/Vacancies) ලබාගත හැක.

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය – 2026 නොවැම්බර් 02

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය,**
**2P/17B,**
**කාර්මික ජනපදය**
**ඒකල, ජා ඇල.**

Gazette.lk

**Tel 0113 500 015, 0112 236 284, 0112 236 384, 0112 236 307**
**Fax - 0112 236 434**
**Web - www.nerdc.lk**